සැ. යු.-2010.07..02 වැනි දින පළ වූ අංක 1,661 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,662 - 2010 ජූලි මස 09 වැනි සිකුරාදා - 2010.07.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1076 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1076 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1073 - B 079882 — 8880 (2010/07)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකියඃ-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල ක්වාසි තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කලහැක.

අයදුම්කරු මුස්ලිම් පිරිමියකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මවුලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලීම් සහතිකය දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකු විය යුතුය.

දැනට රජයේ සේවයේ නියුක්ත අයෙකුට මේ සඳහා අයදුම් කල නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුල යහපත් පිළිගැනීමක් ඇති විවාහකයකු විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුල ස්ථිර පදිංචිව සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයකුට මසකට රුපියල් 6,000 ක දීමනාවකට අමතරව සහයක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 5,000 ක ගෙවීමක් කරනු ලැබේ.

අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මඟින් ලබාගත හැකි අතර, අයදුම්පත් 2010 අගෝස්තු මස 09 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

එම්. පී. ද සිල්වා,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2010 ජුනි මස 23 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

01. කොළඹ (බටහිර) :- කොළඹ අධිකරණ කොට්ඨාසයේ දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල, හා අතුරුගිරිය යන ප්‍රදේශ වල ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

02. උඩපලාත (ගම්පොල) :- ගම්පොල අධිකරණ බල ප්‍රදේශය ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

03. නාවලපිටිය :- මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගමුව ආදායම් කොට්ඨාසය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හපුගස්තලාව ග්‍රාමය යන ප්‍රදේශවලින් සමන්විත ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

04. අඩ්ඩාලච්චේනයි :- අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලච්චේනයි උප දිසාපති කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

07-305

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ, II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2010 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වේ. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් විභාගය පවත්වනු ලබන අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනිකුත් විධි විධාන, අංක 1070/13- 1999 මාර්තු මස 11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථාවල දී හෝ පෙනී සිටිය හැක.

**(අ) විෂය නිර්දේශය**

| *විෂය අංකය* | *විෂය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, | 100 යි | පැය 1 1/2 යි. |

xxviii, xxx හා xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති

02. *මුදල් රෙගුලාසි.*—රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1වැනි කොටසේ i, ii, v, viii, xii, හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව — 100 යි — පැය 1 1/2 යි

03. *අධ්‍යාපන නීතිය* — 100 යි — පැය 2යි
අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ.

i. 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි

ii. 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත

iii. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත

iv. 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත

v. 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත

vi. 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත

vii. 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත

viii. 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත

ix. 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත

x. 13 වැනි සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

xi. අධ්‍යාපනයට අදාළව පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති

සැ. යු.- අපේක්ෂකයින් කාර්යක්ෂමතා විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40% ක් බැගින් වූ ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

03. *විභාගයේ භාෂා මාධ්‍යය* :

(i) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ යන එකකින් පිළිතුරු ලිවිය හැකිය.

(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍ය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

04. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකසා ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ සියලුම ශීර්ෂයන් පළමුවන පිටුවට වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිළිව සඳහන් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතු ය.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම් පත්‍ර 2010 අගෝස්තු මස 06 වැනි දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම් පත්‍රයක් වුව ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 -II කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවුයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

10. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර, ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් වලංගු වේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය.

(අ) පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) සම්පූර්ණ විභාග ගාස්තු රු. 150 කි.
එක් විෂයකට රු. 50 කි.

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-20-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙව ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයෙන් අලවන්න. (තවද එහි ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.)

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජුනි මස 07 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010
Efficiency Bar Examination in Class 2 Grade II of Sri Lanka Teacher Educators' Service -2010

ඉල්ලුම් පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනය වෙත ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

(විභාගයේ නම, කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින
භාෂා මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : SILVA, A. B.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3. (i) පදවි නාමය :————.

(ii) සේවය කරන විද්‍යා පීඨය/ගුරු විද්‍යාල/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ) :————.

4. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

5. නිවේදනයේ 2 වැනි ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| විෂය අංකය | විෂයයේ නම |
|---|---|
| | |
| | |
| | |

6. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද ? එසේ නම් විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| විෂය | වර්ෂය | මාධ්‍යය | විභාග අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

7. *ගෙවන ලද විභාග ගාස්තු :*

| |
|---|
| විභාග ගාස්තු ගෙවා ලදුපත මෙහි අලවන්න. ඡායා පිටපත ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. |

8. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

02. අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බව සහතික කරමි.

————,
පීඨාධිපතිගේ/ගුරු මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන හා පදවි නාමය.

දිනය :————.

07-191

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2011

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ගුරු අධ්‍යාපනය පිළිබඳව තුන් අවුරුදු පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතාවය :*

*සෑම අයැදුම්කරුවකුම :*

2.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

2.2 විශිෂ්ට චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතුය.

2.3 *වයස :*

2.3.1. 2011.01.01 දිනට වයස අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

2.3.2 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට අයදුම්කරන පූජකවරුන් සඳහා 2011.01.01 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

2.3.3 බුද්ධ ධර්මය පාඨමාලාවට ඉල්ලුම් කරන බෞද්ධ භික්ෂූන් වහන්සේලා/මෙහෙණින් වහන්සේලා 2011.01.01 දිනට වයස අවුරුදු 27ට නොවැඩි විය යුතුය.

2.4 අවිවාහක විය යුතුය.

3.0. *මූලික අධ්‍යාපන සුදුසුකම් :*

3.1 2009 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) එකවර සමත් වීම.

(තාක්ෂණ අධ්‍යයන පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.12 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවේ පූජකවරුන් 4.9 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද කියවන්න.)

3.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී/මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළු හර විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන තුනක් (03) සහිතව සමත්වීම. (පළමු අවස්ථාවේ දී අවම වශයෙන් හර විෂයයන් පහකින් (05) සමත් විය යුතුය). හර විෂයයන් - (i) ආගම, (ii) පළමු බස, (iii) ඉංග්‍රීසි, (iv) ගණිතය, (v) සෞන්දර්ය අධ්‍යයනය (චිත්‍ර, නැටුම්, සංගීතය, නාට්‍ය හා රංග කලාව/සාහිත්‍යය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි), (vi) විද්‍යාව හා තාක්‍ෂණවේදය, (vii) සමාජ අධ්‍යයනය හා ඉතිහාසය, (viii) තාක්‍ෂණ විෂයය (කෘෂිකර්මය, ව්‍යාපාර හා ගිණුම්කරණය, හස්ත කර්මාන්තය).

3.3 ඒ ඒ පාඨමාලාවට අදාළ අ.පො.ස (සා.පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතුය. (විශේෂ සුදුසුකම් පිළිබඳව සලකා බලනු ලබන්නේ 3.1 හා 3.2 හි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පමණි.) විශේෂ සුදුසුකම් පිළිබඳව විශේෂයෙන් සඳහන් කර නොමැති විටෙක 3.1 හා 3.2 හි සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.

3.4 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හා ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය.

3.4.1. ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම්කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ.

3.4.2 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ. අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් සමත්ව ඇති අයදුම්කරුවන් අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ප්‍රමාණවත් වේ. කෙසේ වුව ද ප්‍රවීණතා පරීක්ෂණයේ දී සමාන ලකුණක් ලබා ඇති අයදුම්කරුවන් කීප දෙනෙකු අතරින් එක් අයෙක් තෝරා ගැනීමට සිදුවන විටෙක දී පළමු වරට අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ලබාගත් ප්‍රතිඵල සැළකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 04ක් ද, අධිසම්මාන සාමාර්ථයකට ලකුණු 03 ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01ක් ද, බැගින් ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08කට පමණක් සීමා කෙරේ.

3.4.3 තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා බටහිර සංගීතය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වුව ද, සිංහල හා දෙමළ මාධ්‍යය පාසල්වල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කොටගෙන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් අ.පො.ස. (උ.පෙළ) හැදෑරූ සිසුන් අතුරින් බඳවා ගනු ලැබේ.

3.5 සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන සියලුම අධ්‍යාපන/වෘත්තිය සහතිකවල වලංගු දිනය ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

4.0 *අධ්‍යාපන සුදුසුකම් හා විශේෂ අවශ්‍යතා.-* ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා පහත දැක්වේ :

4.1 පාඨමාලා අංකය 01 - ප්‍රාථමික අධ්‍යාපනය - (සිංහල)
ප්‍රාථමික අධ්‍යාපනය - (දෙමළ)

4.1.1 2009 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයය තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයයන් දෙකකින්) සමත්වීම;

*හා*

4.1.2 සිංහල/දෙමළ භාෂාවට හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව ගණිතය ඇතුළුව හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැලකිය යුතුයි* :

2013 වසර සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ප්‍රාථමික පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අනිවාර්ය වේ.

4.2 පාඨමාලා අංකය 02 - විද්‍යාව (සිංහල)
විද්‍යාව (දෙමළ)
විද්‍යාව (ඉංග්‍රීසි)

4.2.1 2009 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනෙන් (03) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ජීව විද්‍යාව විෂයය ඇතුළුව ඉහත විෂයයන් දෙකකින්) සමත්වීම ;

*හා*

4.2.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 32 ගණිතය හෝ 42 ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැලකිය යුතුයි*

* **විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා**

(i) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.2.1 හා 4.2.2 සුදුසුකම් සපුරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද,

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.2.1 හා 4.2.2 සුදුසුකම් සපුරා සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද තෝරා ගනු ලැබේ.

4.3 **පාඨමාලා අංකය 03 - ගණිතය (සිංහල)**
**ගණිතය (දෙමළ)**
**ගණිතය (ඉංග්‍රීසි)**

4.3.1 2009 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා ගණිතය විෂයය ධාරාවට අයත් ගණිතය, සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන් එකක් සහිතව ඉහත විෂයයන් දෙකකින්) සමත්වීම;

*හා*

4.3.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා 34 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

*සැලකිය යුතුයි*

*** ගණිතය (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා**

(i) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.3.1 හා 4.3.2 සුදුසුකම් සපුරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද,

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.3.1 හා 4.3.2 සුදුසුකම් සපුරා සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන් අතුරින් 50% ද තෝරා ගනු ලැබේ.

**4.4 පාඨමාලා අංකය 04 - ශාරීරික අධ්‍යාපනය (සිංහල)**

**- ශාරීරික අධ්‍යාපනය (දෙමළ)**

4.4.1 2009 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම;

*හා*

4.4.2 සිංහල/දෙමළ භාෂාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් සමත්වීම;

*හා*

4.4.3 පිළිගත්, ජවන හා පිටිය මළල ක්‍රීඩා සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් ලබා තිබීම, විවිධ ක්‍රීඩා/ඉසව් තුනකට උපරිම වශයෙන් ලකුණු 75ක් ප්‍රදානය කිරීම පහත දැක්වෙන අනුපිළිවෙලට සිදුකරනු ලැබේ.

***ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙල***

| *අනු. අංකය* | *මට්ටම/විෂය* | *කේවල* | *සමූහ* | *ස්ථානය/ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 22 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 21 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 20 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 19 |
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 18 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 17 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 16 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 15 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 14 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 13 |
| 14 | පළාත් මට්ටම | කේවල | - | 1 | 12 |
| 15 | පළාත් මට්ටම | කේවල | - | 2 | 11 |
| 16 | පළාත් මට්ටම | කේවල | - | 3 | 10 |
| 17 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 09 |
| 18 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 08 |
| 19 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 07 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/බළලත් නිලධාරි 1 | - | - | - | 06 |
| 21 | ජනාධිපති බාලදක්ෂ/බාලදක්ෂිකා | - | - | - | 06 |
| 22 | සාජන්ට් මේජර්/බළලත් නිලධාරි 2 | - | - | - | 05 |
| 23 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 1 | 06 |
| 24 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 2 | 05 |
| 25 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 3 | 04 |
| 26 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 1 | 03 |
| 27 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 2 | 02 |
| 28 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 3 | 01 |

4.4.4 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට ඔවුන් ලබා ඇති සාමාර්ථයන් අනුව අතිරේක ලකුණු හිමිවේ.

A සාමාර්ථය - 05
B සාමාර්ථය - 03
C සාමාර්ථය - 02

*සැළකිය යුතුයි* :

(i) *පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික).*- අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (වෙස්, කැරම්,දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගි වන අන්තර් ජාතික තරග (පාසල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගි වන අන්තර් ජාතික තරග සලකා නොබැලේ.)

(ii) *පිළිගත් ක්‍රීඩා තරග.*- අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරග/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරග.

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද ඒ ශ්‍රේණියේ තරගවල 1,2 හා 3 වැනි ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ 05 තුළ ලබාගත් ක්‍රීඩා ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් මේ සඳහා වලංගු වේ.

(v) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමි වන්නේ එකම ඉසව්වකට එකම වසරක දී ලබාගත් සහතිකවලින් එක් ඉහළම සහතිකයකට පමණි.

**4.5 පාඨමාලා අංක 05 - ඉංග්‍රීසි**

4.5.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (සාමාන්‍ය ඉංග්‍රීසි නොවේ) ඇතුළුව විෂයය තුනකින් සමත්වීම හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම ;

*හෝ*

4.5.2 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය තුනකින් සමත්වීම හා 2009 වර්ෂයේ දී පවත්වන ලද ලන්ඩන් අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් තුනකින් එකවර සමත්වීම සහ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් සමත්වීම ;

*හෝ*

4.5.3 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම හා අ. පො. ස (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධිසම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :

(i) ඉංග්‍රීසි පාඨමාලාවට තෝරා ගැනීමේ දී 4.5.1 හා 4. 5. 2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. ඔවුන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතුය.

(ii) 4.5.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණයෙහි ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

4.6 *පාඨමාලා අංකය 06 - බුද්ධ ධර්මය*

බුද්ධ ධර්මය පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද, මෙහෙණින් වහන්සේලාට ද, ගිහි අයදුම්කරුවන්ට ද ඉල්ලුම් කළ හැකිය. සියලුම අවශ්‍යතා 2009 වසරේ හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය. (ගිහි අයදුම්කරුවන්ගේ සියලුම අධ්‍යාපන සුදුසුකම් 2009 වසරේ හෝ ඊට පෙර ගිහි නමින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.)

4.6.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි හා සිංහල යන විෂයයන්ගෙන් දෙකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම.

4.6.2 ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම (බෞද්ධ භික්ෂූන් වහන්සේලාට/මෙහෙණින් වහන්සේලාට පමණි.)

4.6.3 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත්වීම.

4.6.4 දහම් පාසල් අවසාන විභාගය සමත්වීම

4.6.5 සිංහල භාෂාව, බුද්ධ ධර්මය හා ගණිතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ)/සිංහල භාෂාව, ගණිතය, ත්‍රිපිටක ධර්මය ඇතුළු හර විෂයයන් හයකින් (06) මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සමත්වීම.

*සැලකිය යුතුයි :*

(i) තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල -

(අ) 4.6.1, 4.6.2, 4.6.3, 4.6.4, 4.6.5 යන සියලුම සහතික ඇති අයදුම්කරුවන්
(ආ) 4.6.1, 4.6.2 සහ 4.6.5 සහතික ඇති අයදුම්කරුවන්
(ඉ) 4.6.1, 4.6.3, 4.6.5 සහතික ඇති අයදුම්කරුවන්
(ඊ) 4.6.1, 4.6.4, 4.6.5 සහතික ඇති අයදුම්කරුවන්
(උ) 4.6.1, 4.6.5 සහතික ඇති අයදුම්කරුවන්

**4.7 පාඨමාලා අංකය 07 - හින්දු ධර්මය**

4.7.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී හින්දු ධර්මය, හින්දු ශිෂ්ටාචාරය හා සංස්කෘත යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම
4.7.2 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම
4.7.3 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම
4.7.4 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.
4.7.5 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දු ධර්මය ඇතුළු හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

***සැලකිය යුතුයි.—තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල***

(අ) 4.7.1, 4.7.5. සහ අනිකුත් සියලුම සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.7.1, 4.7.4, 4.7.5 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
(ඉ) 4.7.1, 4.7.5 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්
(ඊ) 4.7.1, 4.7.5. සහතික ලැබූ අයදුම්කරුවන්

ඉහත සඳහන් සියලුම අවශ්‍යතා 2009 වර්ෂයේ දී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.

**4.8 *පාඨමාලා අංකය 08 - ඉස්ලාම් ධර්මය***

4.8.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ටාචාරය හා අරාබි යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම
4.8.2 අල්-ආලිම් විභාගය (1 වැනි කොටස හා 2 වැනි කොටස යන දෙකෙන්ම) සමත් වීම,
4.8.3 මෞලවි සහතිකය ලබා තිබීම හා අල් - ආලිම් විභාගය 1 කොටස සමත්වීම,
4.8.4 මෞලවි සහතිකය ලබා තිබීම
4.8.5 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුළු හර විෂයයන් 06 කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම

සැලකිය යුතුයි - **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල -**

(අ) 4.8.1, 4.8.5. සහ ඉහත සියලුම සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.8.1, 4.8.3, 4.8.4 සහ 4.8.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඉ) 4.8.1, 4.8.4 සහ 4.8.5 සහතික හිමි අයදුම්කරුවන්
(ඊ) 4.8.1 සහ 4.8.5 සහතික හිමි අයදුම්කරුවන්

ඉහත සඳහන් සියළුම අවශ්‍යතා 2009 වර්ෂයේ දී හෝ ඊට පෙර ලබා තිබිය යුතුයි.

**4.9 පාඨමාලා අංකය 09 - කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (සිංහල)**
**කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (දෙමළ)**

4.9.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

සිංහල/දෙමළ භාෂාව, ගණිතය සාමාර්ථයද ඇතුළුව හර විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

*හා*

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ක්‍රිස්තු ධර්මය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය විෂයයට සම්මාන සාමාර්ථයක් ;

*හා*

අයැදුම්කරු කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලිකයන් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය ද ක්‍රිස්තියානියන් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය ද ලබා තිබීම.

4.9.2 කතෝලික ධර්මය අයැදුම්කරුවන් තෝරා ගැනීම පහත දැක්වෙන සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී සිදුකරනු ලැබේ. :-

4.9.2.1 ජාතික දෙවි සත්හලේ දේව ධර්මය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා සහතිකය ;

*හෝ*

4.9.2.2 ජාතික දෙවි සත්හලේ කිතුනු දර්ශනය පිළිබඳ පාඨමාලා සහතිකය ;

*හෝ*

4.9.2.3 දේව ධර්ම නිකේතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය ;

*හෝ*

4.9.2.4 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යයන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකායන්ගේ ශ්‍රේෂ්ඨාධිපති/ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමන් විසින් නිකුත් කරන ලද සහතිකය ;

*හෝ*

4.9.2.5 ජාතික ධර්මෝපදේශක මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන කතෝලික ධර්මාචාර්ය (දහම් ගුරු) විභාගයක් සමත්වීම

එනම් ;
ධර්මාචාර්ය ගෞරව (දහම් ගුරු 3) ;
*හෝ*
ධර්මාචාර්ය විශේෂ (දහම් ගුරු 2) ;
*හෝ*
ධර්මාචාර්ය සාමාන්‍යය (දහම් ගුරු 1) ;
*හෝ*

4.9.2.6 අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ක්‍රිස්තියානි ධර්මය විෂයය සමත්වීම.

4.9.3 ක්‍රිස්තු ධර්මය අයැදුම්කරුවන් තෝරාගැනීම අනුපිළිවෙලින් පහත දැක්වෙන සුදුසුකම් අනුව කරනු ලැබේ. :-

4.9.3.1 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

4.9.3.2 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම.

සැළකිය යුතුයි - (i) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 90% ක් තෝරා ගැනීම සඳහා 4.9.1 යටතේ සුදුසුකම් ලබන කතෝලික අයැදුම්කරුවන් අතරින් 4.9.2 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. 90% කතෝලික අයැදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ක්‍රිස්තියානි අයැදුම්කරුවන් තෝරාගනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 10% ක් 4.9.1 යටතේ සුදුසුකම් ලබන ක්‍රිස්තු ධර්මය අයැදුම්කරුවන් අතරින් 4.9.3 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. 10% ක් ක්‍රිස්තියානි අයැදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා කතෝලික අයැදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු අයැදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40%ක් කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. 40% ක පූජක පක්ෂයේ අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයැදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) පූජක පක්ෂයේ අයැදුම්කරුවන් අතර 2009 වර්ෂයේ අ. පො. ස. (උසස් පෙළ) සමත් වූ අයැදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2008, 2007, 2006, 2005 සහ 2004 යන වර්ෂයට අනුපිළිවෙලින් ආසන්නතම වර්ෂ සලකා අ. පො. ස. (උසස් පෙළ) සමත්වූ පූජක/පැවිදි පක්ෂයේ අයැදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ.

4.10 **පාඨමාලා අංකය 10 - විශේෂ අධ්‍යාපනය (සිංහල)**
**විශේෂ අධ්‍යාපනය (දෙමළ)**

4.10.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (03) සමත්වීම ;

*හා*

4.10.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) සමත් වීම.

*සැළකිය යුතුයි.*—මෙම පාඨමාලාවට තෝරා ගනු ලබන අයැදුම්කරුවන්ට පුහුණුවෙන් පසුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශ්‍රවන, දෘෂ්ටි, බුද්ධිමය ඌනතා, ඕටිසම්, ඉගෙනුම් දුෂ්කරතා, බහුවිධ දුබලතා ආදී ක්ෂෙත්‍ර සඳහා ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දීම සඳහා සලකා බලනු ඇත. එබැවින් ඉහත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සිටින පංතිවල සේවය කිරීමට එකග වන අයැදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතු වේ.

4.11 **පාඨමාලා අංකය 11 - කෘෂි හා ආහාර තාක්‍ෂණය (සිංහල)**
**කෘෂි හා ආහාර තාක්‍ෂණය (දෙමළ)**

4.11.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂිවිද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන් 03න් සමත්වීම ;

*හෝ*

4.11.2 2009 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී කෘෂිකර්මය/කෘෂි තාක්‍ෂණවේදය/ජෛව සම්පත් තාක්‍ෂණවේදය/ආහාර තාක්‍ෂණවේදය විෂයය ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම.

*හා*

4.11.3 ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළු හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ.) සමත්වීම.

*සැළකිය යුතුයි.*—සිසුන් බඳවා ගැනීමේදී 4.11.1 සුදුසුකම් ඇති අයැදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.

2013 වසර සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල කෘෂි හා ආහාර තාක්‍ෂණය පාඨමාලාවට බඳවා ගැනීමේ දී,

1. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය සහ විද්‍යාව, කෘෂිකර්මය/කෘෂි හා ආහාර තාක්‍ෂණය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ලබා තිබීම අනිවාර්ය වේ.

2. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂිවිද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන් 03න් සමත්වීම සහ රජයේ පිළිගත් කෘෂිකර්ම විද්‍යාලයක වසරක් හෝ ඊට වඩා වැඩි කෘෂිකර්ම පාඨමාලාවක් හදාරා සාර්ථක ලෙස නිම කර සහතිකයක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

4.12 **පාඨමාලා අංක 12 - තාක්‍ෂණ අධ්‍යයනය (සිංහල)**
**තාක්‍ෂණ අධ්‍යයනය (දෙමළ)**

4.12.1 නිර්මාණකරණය හා තාක්ෂණවේදය

4.12.1.1 2009 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී තාක්‍ෂණවේදය විෂය මාලාවට අයත් දෘඪ තාක්‍ෂණවේදය සංරචකයට අයත් සිවිල් තාක්‍ෂණවේදය, යාන්ත්‍රික තාක්‍ෂණවේදය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්‍ෂණ වේදය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයන් 03කින් සමත්වීම ;

*හෝ*

4.12.1.2 2009 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් 3 කින් සමත්වීම ;

*හා*

4.12.1.3 ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද,/ඉදිකිරීම් තාක්‍ෂණය,/යාන්ත්‍රික තාක්‍ෂණය/විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව හර විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.12.2 ශිල්ප කලා :

4.12.2.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් 3 කින් සමත් වීම ;

*හා*

4.12.2.2 ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ශිල්ප කලා ඇතුළුව හර විෂයයන් හයකින් (06) කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

*හා*

4.12.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තීය පුහුණු අධිකාරිය/පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව/කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව/වෙනත් මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් යටතේ හෝ පාලනය වන ආයතනයක් මඟින් පවත්වන, විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස 10කට නොඅඩු විෂයය ක්‍ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

*සැළකිය යුතුයි* :-

(i) තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල :

* **නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය**

(අ) 4.12.1.1 හා 4.12.1.3 සහතික ඇති අයැදුම්කරුවන්
(ආ) 4.12.1.2, 4.12.1.3 හා 4.12.3 සහතික ඇති අයැදුම්කරුවන්

එසේ වුවද ඉහත (අ), (ආ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2008 සහ 2007 වසරවලදී (අ) හෝ (ආ) සුදුසුකම් ලද අයැදුම්කරුවන් පිළිවෙලින් සලකා බැලේ.

* **ශිල්ප කලා**

(අ) 4.12.2.1, 4.12.2.2 හා 4.12.3 සහතික ඇති අයැදුම්කරුවන්
(ආ) 4.12.2.1 හා 4.12.2.2 සහතික ඇති අයැදුම්කරුවන්

ඉහත (අ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2008 සහ 2007 වසර වලදී (අ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙලින් සලකා බැලේ. තවදුරටත් පුරප්පාඩු පැවතිය හොත් පමණක් ඉහත (ආ) හි සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් 2009, 2008, 2007 ප්‍රමුඛතා අනුපිළිවෙලින් බඳවා ගැනීම සඳහා සලකා බැලේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ අංක 16.1 යටතේ ඉල්ලුම් කරන විෂය ක්ෂත්‍රය (නිර්මාණකරණය හා තාක්‍ෂණයවේදය/ශිල්ප කලා යන්න) පැහැදිලිව සටහන් කළ යුතුය.

(iii) ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

4.13 **පාඨමාලා අංක 13 - චිත්‍ර (දෙමළ)**

4.13.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍රකලා විෂයය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.13.2 දෙමළ භාෂාව, ගණිතය හා චිත්‍ර ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.13.3 2009 වසරේ අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ දී චිත්‍ර/චිත්‍ර හා මූර්ති විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

4.14 *පාඨමාලා අංක 14 - නැටුම් (භරත)*

4.14.1 2009 වර්ෂයේදී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී භරත නැටුම් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට භරත නැටුම් ඇතුළු විෂයය දෙකකින්) සමත්වීම ;

*හා*

4.14.2 දෙමළ භාෂාව, ගණිතය හා භරත නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.14.3 2009 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය අනුව අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

*සැලකිය යුතුයි.*—(ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී භරත නැටුම් විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලැබේ.)

4.15 **පාඨමාලා අංකය 15 - සංගීතය (කර්ණාට)**

4.15.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් තුනකින් (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා කර්ණාට සංගීතය ඇතුළු විෂයයන් දෙකකින්) සමත්වීම ;

*හා*

4.15.2 දෙමළ භාෂාව, ගණිතය හා කර්ණාට සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.15.3 2009 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාට) විෂය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

*සැලකිය යුතුයි* :

(i) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලැබේ.)

4.16 **පාඨමාලා අංකය 16 - බටහිර සංගීතය (ඉංග්‍රීසි)**

4.16.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළු විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

*හෝ*

4.16.2 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම

හා

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (න්‍යායික හා ප්‍රායෝගික);

හෝ

අ. පො. ස. (උ. පෙළ) බටහිර සංගීතය විෂයය අමතර විෂයයක් ලෙස සමත්ව තිබීම.

*සැලකිය යුතුයි* :-

(i) බටහිර සංගීත පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟාවීම.

(ii) එම පාඨමාලාවට තෝරා ගැනීමේ දී ඉහත 4.16.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**4.17. පාඨමාලා අංක 17 - නාට්‍ය හා රංග කලාව (දෙමළ)**

4.17.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය ඇතුළු විෂයයන් තුනකින් සමත්වීම;

හා

4.17.2 දෙමළ භාෂාව ද ගණිතය සහ නාට්‍ය හා රංග කලාව/සංගීතය/නැටුම් ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.17.3 2009 වසරේ අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් ප්‍රදානය කරනු ලැබේ.

***සැළකිය යුතුයි.***—බඳවා ගැනීමේදී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සමත් අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. යම් දිස්ත්‍රික්කයක අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් පමණක් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නැටුම්/සංගීතය/චිත්‍ර විෂයය සමත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සලකා බැලේ.

**4.18 පාඨමාලා අංකය 18 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි)**

4.18.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (ශ්‍රීපාද අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත් වීම;

හා

4.18.2 ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :

(i) මෙම පාඨමාලාවට අයැදුම්කරන අයැදුම්කරුවන් තෝරාගැනීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුවේ. (කරුණාකර 6.1.2 ඡේදය බලන්න).
(ii) මෙම ප්‍රශ්න පත්‍රය වාස්තවික වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි. මෙමගින්, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍යවන මූලික ගණිත සංකල්ප සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ නිපුණතාව මැන බැලීම සිදුකෙරේ.
(iii) තෝරාගැනීමේ පරීක්ෂණයට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් පෙනීසිටිය හැකිය.
(iv) තෝරාගැනීමේ පරීක්ෂණයට පෙනීසිටින භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ 1.0 ඡේදයේ (මාධ්‍යය S/T/E තීරුවේ) සටහන් කළ යුතුය.

**4.19 පාඨමාලා අංක 19 - පළමු බස (සිංහල)**

4.19.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා සිංහල විෂයය ඇතුළු විෂයයන් දෙකකින්) අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ) සමත්වීම;

හා

4.19.2 සිංහල භාෂාවට සම්මාන සාමාර්ථය හා ගණිතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.20 පාඨමාලා අංකය 20 - පළමුබස (දෙමළ)**

4.20.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා දෙමළ විෂය ඇතුළු විෂයයන් දෙකකින්, අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ) සමත්වීම.;

*හා*

4.20.2 දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථය හා ගණිතය ඇතුළු හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත් වීම.

**4.21 පාඨමාලා අංකය 21 - දෙවන බස (සිංහල)**

4.21.1 දෙවන බස සිංහල පාඨමාලාවේ අයදුම්කරුවන් 2009 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.21.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළු හර විෂයයන් 06 කින් සමත් වීම.

(**සැළකිය යුතුයි.**—මෙම පාඨමාලාවට බඳවා ගැනීමේදී අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී දෙවන භාෂාව දෙමළ විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව උසස් පාඨමාලාව හෝ වෛකල්පිත දෙමළ භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ).

4.22 **පාඨමාලා අංකය 22 - දෙවන බස (දෙමළ)**

4.22.1 දෙවන බස දෙමළ පාඨමාලාවේ අයදුම්කරුවන් 2009 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.22.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය, දෙමළ භාෂාව ඇතුළු හර විෂයයන් 06 කින් සමත් වීම.

(***සැළකිය යුතුයි.***- මෙම පාඨමාලාවට බඳවා ගැනීමේදී අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී දෙවන බස සිංහල විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ වෛකල්පිත සිංහල විෂයය සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ).

4.23 **පාඨමාලා අංකය 23 - ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ)**

4.23.1 2009 වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

4.23.2 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව දෙමළ භාෂාව, ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

4.24 **පාඨමාලා අංකය 24 - සාමාජීය විද්‍යාව (දෙමළ)**

4.24.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා විෂයයන් දෙකකින්) සමත්වීම;

*හා*

4.24.2 සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.25 **පාඨමාලා අංකය 25 - ව්‍යාපාර හා ගිණුම්කරණය (සිංහල)**
**ව්‍යාපාර හා ගිණුම්කරණය (දෙමළ)**

4.25.1 2009 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී (වාණිජ විෂය ධාරාවට අයත්) ගිණුම්කරණය හා ව්‍යාපාර අධ්‍යයනය ඇතුළු විෂයයන් තුනකින් සමත්වීම;

*හා*

4.25.2 ව්‍යාපාර හා ගිණුම්කරණය/ව්‍යවසායකත්ව අධ්‍යයනය/ගණිතය යන විෂයයන් තුනෙන් අවම වශයෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් හා ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ඇතුළුව හර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

5.0 **පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිතව පහතින් දැක්වේ. :-**

(කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම් පත්‍රය පරිගණකගත කරන්නේ පාඨමාලා අංකය අනුවය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

(i) තීරුව - පාඨමාලා අංකය ;
(ii) තීරුව - පාඨමාලාවේ නම ;
(iii) තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
(iv) තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
(v) තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;

(ඒ ඒ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අංකය පීඨයේ නම ඉදිරියෙන් වරහන් තුළ දැක්වේ.)

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ඒවායේ අංකය | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| *i* | *ii* | *iii* | *iv* | *v* |
| 01 | ප්‍රාථමික අධ්‍යාපනය | (1) ඌව<br>(7) ශ්‍රීපාද<br>(11) පුලතිසිපුර<br>(14) රුහුණ<br>(17) හාපිටිගම | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(15) යාපනය<br>(16) දර්ගා නගර | |
| 02 | විද්‍යාව | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(7) ශ්‍රීපාද | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව<br>(15) යාපනය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(15) යාපනය |
| 03 | ගණිතය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(7) ශ්‍රීපාද | (6) වවුනියා<br>(7) ශ්‍රී පාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව<br>(15) යාපනය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(15) යාපනය |
| 04 | ශාරීරික අධ්‍යාපනය | (1) ඌව | (6) වවුනියා | |
| 05 | ඉංග්‍රීසි | | | (3) මහවැලි<br>(10) පස්දුන්රට<br>(15) යාපනය |
| 06 | බුද්ධ ධර්මය | (4) සාරිපුත්ත<br>(17) හාපිටිගම් | | |
| 07 | හින්දු ධර්මය | | (6) වවුනියා | |
| 08 | ඉස්ලාම් | | (8) අඩ්ඩාලච්චේන | |
| 09 | කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය | (12) වයඹ | (6) වවුනියා | |
| 10 | විශේෂ අධ්‍යාපනය | (17) හාපිටිගම් | (8) අඩ්ඩාලච්චේන<br>(15) යාපනය | |
| 11 | කෘෂි හා ආහාර තාක්ෂණය | (11) පුලතිසිපුර | (6) වවුනියා | |
| 12 | තාක්ෂණ අධ්‍යයනය | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 13 | චිත්‍ර | | (9) මඩකලපුව | |
| 14 | නැටුම් (භරත) | | (7) ශ්‍රීපාද<br>(15) යාපනය | |
| 15 | සංගීතය (කර්ණාට) | | (7) ශ්‍රීපාද<br>(15) යාපනය | |
| 16 | බටහිර සංගීතය | | | (3) මහවැලි |
| 17 | නාට්‍ය හා රංග කලාව | | (15) යාපනය | |

| | | | | |
|---|---|---|---|---|
| 18 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | | (7) ශ්‍රීපාද<br>(13) රුවන්පුර<br>(16) දර්ගා නගර |
| 19 | පළමුබස (සිංහල) | (7) ශ්‍රීපාද<br>(12) වයඹ<br>(14) රුහුණ | | |
| 20 | පළමුබස (දෙමළ) | | (7) ශ්‍රීපාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(16) දර්ගා නගර | |
| 21. | දෙවන බස (සිංහල) | (3) මහවැලි | | |
| 22. | දෙවන බස (දෙමළ) | | (3) මහවැලි | |
| 23. | ගෘහ ආර්ථික විද්‍යාව | | (16) දර්ගා නගර | |
| 24. | සමාජීය විද්‍යාව | | (7) ශ්‍රීපාද<br>(9) මඩකලපුව | |
| 25. | ව්‍යාපාර හා ගිණුම්කරණය | (12) වයඹ | (6) වවුනියා<br>(15) යාපනය | |

(*සැලකිය යුතුයි* :

(i) දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගා නගර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කළ යුත්තේ කාන්තාවන් පමණි.

(ii) චිත්‍ර, නැටුම්, සංගීතය, නාට්‍යය හා රංග කලාව, ගෘහ ආර්ථික විද්‍යාව, සමාජීය විද්‍යාව දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

(iii) බටහිර සංගීතය, තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ද පැවැත්වේ.)

6.0 2011 වර්ෂය සඳහා ශික්‍ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය

**6.1** *තෝරා ගැනීමේ පදනම* :

6.1.1 2014 වසරේ පාසැල් පද්ධතියේ ගුරු අවශ්‍යතාව පදනම් කරගෙන බඳවා ගන්නා ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

6.1.2 බඳවා ගැනීමේ මූලික පදනම Z ලකුණු කුසලතාව වේ. ඉංග්‍රීසි/තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවලට තෝරා ගැනීමේ දී ප්‍රවීණතා පරීක්ෂණය/ක්‍රීඩා කුසලතාව අනුව තෝරාගනු ලැබේ. ප්‍රවීණතා/ක්‍රීඩා කුසලතා එකම ලකුණක සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදුවන විටකදී, පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ලබාගත් ප්‍රතිඵල සැළකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 04ක් ද, අධි සම්මාන සාමාර්ථයකට ලකුණු 03ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01ක්ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08කට පමණක් සීමා කෙරේ. ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හැර අනෙකුත් සියළුම විද්‍යාපීඨවල පවත්වන පාඨමාලා සඳහා ජාතික මට්ටමෙන් 40%ක්ද, දුෂ්කර මට්ටමෙන් 60%ක් ද තෝරාගනු ලැබේ.

6.1.3 විද්‍යාව, ගණිතය, බටහිර සංගීතය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හා ව්‍යාපාර ගිණුම්කරණය පාඨමාලාව සිංහල/දෙමළ මාධ්‍යයෙන්, හැදෑරීමට ඉල්ලුම්කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම්කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් ද, සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව හර විෂයය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම අවශ්‍ය වේ.

6.1.4 ශාරීරික අධ්‍යාපනය, සංගීතය (කර්ණාට), නැටුම් (භරත) සහ බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේදී යෝග්‍යතාවය පිළිබඳව සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතුය.

6.2 *දුෂ්කර දිස්ත්‍රික්ක පදනම* :

6.2.1 දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා බඳවා ගනු ලබන්නේ අධ්‍යාපන පහසුකම් බෙදීයාම අනුව දුෂ්කර යැයි සලකනු ලබන දිස්ත්‍රික්ක 17 ට අයත් අයදුම්කරුවන් ගෙනි.

(මාතලේ, මුලතිව්, අනුරාධපුරය, නුවරඑළිය, වව්නියාව, පොළොන්නරුව, හම්බන්තොට, ත්‍රිකුණාමලය, බදුල්ල, යාපනය, මඩකලපුව, මොණරාගල, කිලිනොච්චිය, අම්පාර, රත්නපුර, මන්නාරම, පුත්තලම)

එක් එක් දිස්ත්‍රික්කයෙන් ඒ ඒ මාධ්‍යයෙන් 2009 අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ගහණයේ සමානුපාතයට සෑම පාඨමාලාවකටම ඒ ඒ දිස්ත්‍රික්කයන් ගෙන් බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

6.2.2 එක් එක් දුෂ්කර දිස්ත්‍රික්කය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටි අවස්ථාවකදී වෙනත් දිස්ත්‍රික්ක වලින් පුරප්පාඩු පුරවනු ලැබේ.

6.2.3 *දිස්ත්‍රික්ක නිර්ණය කිරීම* :

6.2.3.1 යම් පාසල් අපේක්ෂකයෙකුගේ දිස්ත්‍රික්කය වන්නේ පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි මාසයට පෙරාතුව වූ මාසය දක්වා වූ වසර 5 තුළ සම්පූර්ණ කාලය හෝ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 ට වැඩි) ඔහු/ඇය ඉගෙනීම කළ පාසල/පාසැල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.3.2 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු ඊට ප්‍රථමයෙන් පාසැල් අපේක්ෂකයෙකු වශයෙන් පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනීසිට පාසල හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ ප්‍රථමයෙන් එකී විභාගයට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කයයි.

6.2.3.3. යම් පෞද්ගලික අපේක්ෂකයෙකු යම් හෙයකින් පාසැල් අපේක්ෂකයෙකු වශයෙන් අ.පො.ස. (උ. පෙළ) විභාගයට කලින් පෙනී නොසිට පාසැල් හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ අ.පො.ස. (උ. පෙළ) විභාගයට පළමුවරට පෙනීසිටි මාසයට පෙරාතුවම වූ මාසයේ අවසාන දිනය දක්වා ඇති වර්ෂ 05 තුළ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) අධ්‍යාපනය ලැබූ පාසල හෝ පාසැල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.3.4 පාසලක අධ්‍යාපනය නොලැබූ පෞද්ගලික අපේක්ෂකයෙකු නම් ග්‍රාමසේවා නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්ගේ දිවුරුම් ප්‍රකාශයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාම ලේඛනය මගින් පමණක් ඉහත දිස්ත්‍රික්කයට පදිංචිය තහවුරු කළ යුතුය.

6.3 *ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම* :

6.3.1 පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75% ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25% ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

6.3.1.1 වතු පාසැල් පිහිටි දිස්ත්‍රික්කවල පවත්නා පුරප්පාඩුවල ප්‍රමාණාත්මක භාවය අනුව අයදුම්කරුවන්ගෙන් 35% ක් මොණරාගල, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවලට වෙන් කෙරේ.

6.3.2 දෙමළ මාධ්‍ය පාඨමාලා සඳහා 75% ක් ද, සිංහල මාධ්‍ය පාඨමාලා සඳහා 25% ක් ද තෝරා ගනු ලැබේ.

6.3.3 ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, පළමුබස, (සිංහල) යන පාඨමාලා සිංහල මාධ්‍යයෙන්ද, ප්‍රාථමික, ගණිතය, විද්‍යාව, කර්ණාට සංගීතය, භරත නැටුම්, පළමු බස (දෙමළ), සමාජීය විද්‍යාව, යන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද, තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වේ. (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පැවැත්වෙන්නේ ඉහත පාඨමාලා පමණි.)

6.3.4

6.3.4.1 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි දරුවන් පමණි. දැනටමත් වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ.

6.3.4.2 වතු අංශයේ සේවය කරන අයගේ දරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටක, දැනට වතු අංශයේ සේවය නොකළ ද 2000 හෝ ඊට පසු වර්ෂවල වතු අංශයේ අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ අයගේ දරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමිවන්නේ 2009, 2008, 2007 ආදී වශයෙන් අනුපිළිවෙලිනි.)

6.3.4.3 යම් දෙමළ මාධ්‍ය පාඨමාලාවකට ඉහත අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලබන ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් ඉහත දිස්ත්‍රික්ක වල පදිංචි වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් ඉන්දියානු සම්භවයක් සහිත දරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6.3.4.4. ඒ අනුව ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් දිස්ත්‍රික්ක වල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6.3.4.5 වැවිලි අංශයේ සේවය නොකරන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයැදුම්කරුවන් සහ වෙනත් දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයැදුම්කරුවන් සඳහා අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නියමිත විෂයන් 03ක් සමත්වීම අනිවාර්ය වේ.

6.3.4.6 සිංහල මාධ්‍ය පාඨමාලාවලට වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ පදිංචිකරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ වෙනත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල එම පාඨමාලාවලට අයැදුම්කර ඇති අයැදුම්කරුවන් අතුරින් Z අගය පදනම් කර ගනිමිනි.

6.3.5 රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා වතු අධිකාරිගේ ලිපිය (සේවකයා සේවය කළ දින වකවානු සහිතව) පසුගිය වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් වැවිලි අංශයේ සේවයේ නියුතු හා වතුවල ස්ථිරව පදිංචිව සිටින බවට/වතු සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය වර්ෂය සහ දිනය පැහැදිලිව සඳහන් වන, වතු අධිකාරි විසින් සහතික කරන ලද ලිපිය අවශ්‍ය වේ. පුහුණුවෙන් පසුව වතු අංශයේ පාසැල්වල අඛණ්ඩව වසර 10 ක් සේවය කරන බවට පොරොන්දු වන ලිපියක් හා සේවක අර්ථසාධක අරමුදලට අය කිරීම් කරන බව ලියාපදිංචි අංක සහිතව ඔප්පු කරන ලිපි සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුවේ. ඉල්ලුම්කරුගේ දිස්ත්‍රික්කය නිර්ණය කිරීමේ පදනම දැක්වෙන 6.2.2 ඡේදය ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම්කරුවන් තෝරා ගැනීමේ දී ද අදාළ කරගනු ලැබේ.

6.3.6 අදාළ සෑම දිස්ත්‍රික්කයකින්ම අවම වශයෙන් එක් අයැදුම්කරුවෙකුවත් තෝරා ගැනීම සඳහා සළකා බලනු ලැබේ.

*සැලකිය යුතුයි* - සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවයක් ඇති අයදුම්කරුවෙකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන්ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවෙකු නම් සිංහල මාධ්‍යය ප්‍රතිශතය සඳහා සළකා බලනු ලැබේ.

7.0 *තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු :*

7.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මුලික පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් තෝරා ගනු නොලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමකට ළඟා වීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික මානසික යෝග්‍යතාව පිළිබඳ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වූ අවස්ථාවක එකී තත්ත්වයන් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් නොවේ නම් විශේෂ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක පරීක්ෂණයකට භාජනය කොට එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

7.4 තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට දින 03 ක් ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ඇයට අහිමි වනු ඇත. මේ අනුව ඇති වන පුරප්පාඩු කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.

7.4.1 එබැවින් නියමිත දිනට ලියාපදිංචි නොවන අයදුම්කරුවන් විසින් පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව කිසිසේත්ම සලකා බැලීමට අවස්ථාව නොමැති බව අවධාරණය කෙරේ.

7.5 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත දැයි පරීක්ෂාකර බැලීම සඳහා විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6 යම් පාඨමාලාවකට/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට තෝරා ගත් පසු ඒ පාඨමාලාව/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ළඟම ඇති විද්‍යාපීඨයකට අදාළ පාඨමාලාව හැදෑරීමට මාරු කරනු ලැබේ.

7.7 යම්කිසි පාඨමාලාවක් සඳහා තෝරා ගැනීමේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී යම්කිසි එකම Z අගයක් ලබා ගෙන ඇති අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව තවදුරටත් තෝරා ගත යුතු පුරප්පාඩු සංඛ්‍යාවට වැඩිනම්, අදාළ අයදුම්කරුවන්ගේ පළමු වරට අ.පො.ස. (සා. පෙළ) විභාගයට ලබාගත් ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 04 ක් ද, අධි සම්මාන සාමාර්ථයකට ලකුණු 3ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02 ක්ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01 ක්ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08 කට පමණක් සීමා කෙරේ.

8.0 *පාඨමාලා සඳහා අයැදුම් කිරීමට හෝ ඇතුළත්වීමට නුසුදුස්සන් :*

8.1 දැනටමත් රජයේ හෝ පෞද්ගලික පාසැල්වල ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,

8.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරන හෝ හැදෑරූ අය,

8.4 විශ්ව විද්‍යාලයක/විශ්ව විද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම් වලින් බඳවා ගන්නා පාඨමාලාවක ලියාපදිංචි/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය. (දැනට ඉහත ආයතනයක ලියාපදිංචි වී සිටින සිසුන් ලියාපදිංචිය අවලංගු කර ගත්තද ඔවුහු අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.)

8.5 විනයානුකූල හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ඉවත් කරනු ලැබූ අය.

9.0 *පුහුණුව සඳහා අදාළ කොන්දේසි* :

9.1 පුහුණු පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්තව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90% කට නොඅඩු විය යුතුය.

9.2 සෑම ශික්ෂණලාභියෙකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ පරීක්ෂණ වලින් ද දෙවන වසර අවසානයේ පවත්වනු ලබන අභ්‍යන්තර පරීක්ෂණ වලින් ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතුයි. එමෙන්ම ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාව හදාරණ අය හැර අනෙක් සියළුම පාඨමාලා හදාරන අය ඉහත විභාග වලදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතුය. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ එම කොන්දේසි වලට එකඟ වන අය පමණි.

9.3 ශික්ෂණලාභියෙකුට නේවාසික පුහුණුව ලබන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස 10 ක් සඳහා මාසයකට රු. 2,000 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසි වර්ෂය තුළ දී මාස 10 ක් සඳහා මාසයකට රු. 2,500 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතුය.

9.4 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විශ්ව විද්‍යාලයක, විශ්ව විද්‍යාල විද්‍යායතනයක, වෙනත් ආයතනයක උසස් පෙළ සුදුසුකම්වලින් බඳවා ගන්නා පාඨමාලාවක, අභ්‍යන්තර ශිෂයෙකු වශයෙන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. එසේ පාඨමාලාවක නිරත වන බව සනාථ වුවහොත් ශික්ෂණලාභියා අත්සන් තබන බැඳුම්කරයෙහි මුළු වටිනාකම (රු. 500,000) අය කරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.5 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියා විවාහවුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ. භික්ෂුන් වහන්සේලා/පූජකවරුන් ලියාපදිංචි වීමෙන් පසු උපැවිදි වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව අවසන් කළ පසු සෑම ආගමකටම අයත් පූජ්‍ය/පූජක පක්ෂය උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු 05 ක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹිය යුතුයි.

9.6 පුහුණුවන කාල සීමාව තුළ අපේක්ෂිත හැසිරීම. උද්යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන ශික්ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේම ශාස්ත්‍රීය පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අසමත් හෝ 9.4 ඡේදයේ දැක්වෙන පාඨමාලාවක් හදාරන බව සනාථ වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යායතනික මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.7 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියාගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත විශේෂ සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට ඉදිරිපත් කර අවසාන තීරණය ගනු ලැබේ.

9.8 පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන්ම සහභාගි විය යුතු විෂයය සමගාමී කටයුතු ඇතුළු) පුහුණුවීම් කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.9 මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන් පුරප්පාඩු පවත්නා දුෂ්කර දිස්ත්‍රික්කවල අධ්‍යාපන කලාප මට්ටමින් ඇති වන ඇබෑර්තු පදනම් කර ගෙන ගුරු පත්වීම් ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.

9.9.1 ගණිතය, විද්‍යාව, වැනි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ශික්ෂණලාභීන් ඔවුන් පත්වීම් ලබන පාසලෙහි ඉංග්‍රීසි මාධ්‍ය ඇබෑර්තු නොමැති වුවහොත් තම මවු බසින් (සිංහල/දෙමළ මාධ්‍යයෙන්) ඉගැන්වීම කළ යුතු වේ.

9.9.2 අනාගතයේ දී රජයේ පාසල්වලට ගුරු පත්වීම් දීමේ දී මෙම පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. එබැවින් පාඨමාලා සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලබන අයදුම්කරුවන් ඉහත කොන්දේසිවලට එකඟවන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් විය යුතුවේ.

9.9.3 ඉහත කොන්දේසි යටතේ පුහුණුව ලබන අයදුම්කරුවන් තමා පත්වීම් ලබන දුෂ්කර දිස්ත්‍රික්කයේ/අධ්‍යාපන කලාපයේ අවම වශයෙන් පත්වීම් දින සිට පස් අවුරුද්දක් (05) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ගිවිසුමකට බැඳිය යුතුය. පත්වීම් ලබා දෙන අධ්‍යාපන කලාපය කිසිසේත් වෙනස් කරනු නොලැබේ.

9.10 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ලියාපදිංචි වන අයදුම්කරුවන් පුහුණුවට වැයවන මුදල සහ වෙනත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 5,00,000 ක බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. පාඨමාලාව අතරමග නවතා ඉවත්වන හෝ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව වසර 05 ක් රජය යටතේ සේවය නොකරන අයෙකු මෙම බැඳුම්කරයෙහි සම්පූර්ණ මුදල රජයට ගෙවීමේ කොන්දේසියකට යටත් වේ.

9.11 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පුහුණුව සඳහා බඳවා ගනු ලබන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, වෛද්‍ය/පෞද්ගලික හේතු මත වෙනස් කර ගැනීමට යම් ශික්ෂණලාභියකු උත්සාහ දරන්නේ නම් ඔහු හෝ ඇය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් නොලබයි.

9.12 සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

10.0 *අයදුම් කිරීම :*

10.1 එක් අයදුම්කරුවෙකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට (03) අයදුම් කළ හැකිය. එකම පාඨමාලාවකට මාධ්‍ය දෙකකින් අයදුම් කළහොත් එය ද පාඨමාලා දෙකකට අයදුම් කළාසේ සැළකේ. එවැනි අයදුම්කරුවෙකුට තවත් එක් පාඨමාලාවකට පමණක් අයදුම් කළ හැකිය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා බුද්ධ ධර්මය පාඨමාලාවට ද, කතෝලික, හින්දු, ඉස්ලාම් පූජක තුමන්ලා අදාළ ආගමික පාඨමාලාවලට ද පමණක් අයදුම් කළ යුතුය.

*උදා :* විද්‍යාව පාඨමාලාව සිංහල මාධ්‍යය සහ විද්‍යාව පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යය යන දෙකටම අයදුම්කළ අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණි.

10.2 එක් අයැදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් (02) පමණක් එකම කවරයක බහා ඉදිරිපත්කළ යුතුය. එක් අයදුම්කරුවෙකු විසින් ඉහත ඉල්ලුම්පත් හා සහතික කළ ඡායා පිටපත් දෙක හැර වෙනත් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත්නම් සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10..3 අයැදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතුය.

10.4 අයැදුම්පත්‍ර 2010.07.30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), විද්‍යාපීඨ ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**අයැදුම්පත්‍රය බහා එවන කවරයේ ආදර්ශය පහත දැක්වේ.**

<table>
<tr><td colspan="2">2011 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා අයැදුම්පත්‍රය,<br>පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලා අංකය .........මාධ්‍යය.........<br>ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කරන්නේ ද ඔව්/නැත.</td></tr>
<tr><td></td><td>ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)<br>විද්‍යාපීඨ ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල.</td></tr>
</table>

(විභාග දෙපාර්තමේන්තුවට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට හෝ අයැදුම්පත්‍ර නොඑවිය යුතු බව අවධාරණය කරමි.)

10.5 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එම නිසා ඒවා අයැදුම්කරු ළඟ තබා ගත යුතුය.

10.6 විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය නිවැරදිව ඇතුළත් නොකරන ලද හා අසම්පූර්ණ, අවිධිමත් අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.7 අයැදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10.8 අයැදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය.

10.9 අයැදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයැදුම්කරු සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

11.0 *ගැසට් නිවේදනයේ ඉහත සඳහන් තොරතුරු මත මතුවන ගැටළු පිළිබඳව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.*

12.0 මෙම *ගැසට් නිවේදනයෙහි* සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨමාලා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

සුනිල් එස්. සිරිසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 ජූනි මස 24 වැනි දින,
ඉසුරුපාය, බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේදී.

**අයැදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස්**

1.0 *ගැසට් නිවේදනය* කීපවරක් සැලකිල්ලෙන් කියවන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයැදුම්පත්‍රයක පමණක් අයැදුම් කරන්න. මෙම අයැදුම්පත්‍රය හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කරන්න. (පාසල් අයැදුම්කරුවන් විදුහල්පති මගින් ද, පෞද්ගලික අයැදුම්කරුවන් සාමදාන විනිශ්චයකරුවකු මගින් ද ඡායා පිටපත් දෙක සහතික කරවා ගත යුතුය.)

2.0 පහත දැක්වෙන ආදර්ශය අනුව (Legal)F5 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21.8 x සෙන්ටිමීටර් 33) සුදු කඩදාසියක අයැදුම්පත පිළියෙල කරන්න. 1.0 - 9.5 දක්වා ඡේද පළමුවැනි පිටුවට ඇතුලත් වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවල දී අදාළ කොටුව තුළ "X"ලකුණ යොදන්න.

3.0 අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ පළමු පිටුවේ දැක්වෙන 1.0-9.5 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සළකන්න. විශේෂයෙන්ම පාඨමාලාවේ අංකය, අ.පො.ස (උ.පෙළ) විභාග අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිලිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

4.0 ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 12.0 ඡේදය ද, බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 13.0 ඡේදය ද, කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 14.0 ඡේදය ද, හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 15.0 ඡේදය ද, තාක්ෂණ අධ්‍යයනය සඳහා 16.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා 17.0 ඡේදය ද දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතුයි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේය :-

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | හම්බන්තොට | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | පුත්තලම | 18 |
| කළුතර | 03 | කිලිනොච්චිය | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිව් | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වවුනියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොණරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| | | | | රත්නපුර | 25 |

6.0 මාධ්‍යය සඳහා අදාළ සංකේත මෙසේය ඃ සිංහල -S , දෙමළ - T ඉංග්‍රීසි - E.

*ආදර්ශ අයැදුම්පත්‍රය*

**ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2011**

(අයැදුම්කරුවෙකු එක් අයැදුම්පතක් හා එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයැදුම්පතට අනුකූල නොවන ලෙස සකස් කළ අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ 9 වැනි ඡේදය දක්වා තොරතුරු පළමු පිටුවට ඇතුළත් කරන්න. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරනුයේ. 1.0-9.5 දක්වා තොරතුරු ඇසුරෙනි.)

1.0

| *මනාපය* | *පාඨමාලාවේ අංකය* | *ජා. අ. වි. පීඨයේ අංකය* | *පාඨමාලාවේ මාධ්‍යය* S/T/E | *පාඨමාලා අංක (18) විභාගයට පෙනී සිටින මාධ්‍යය* S/T/E |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |

2.0 2.1 මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් (In Block letters) **නිදසුන** : Mr. PERERA R. C.
Mr./Miss :——————.

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් (In Block letters) :——————.

3.0 ස්ථිර පදිංචි ලිපිනය ඉංග්‍රීසියෙන් (In Block letters) :——————.

දුරකථන අංකය :——————.

4.0 ගැසට් නිවේදනයේ 6.2.3 ඡේදයට අනුව දිස්ත්‍රික්කය :——————. දිස්ත්‍රික් අංකය : ☐

5.0 5.1 උපන් දිනය :

අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ [1] ස්ත්‍රී [2]

7.0 ජන වර්ගය :

| සිංහල | ශ්‍රී ලංකා ද්‍රවිඩ | ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ | මුස්ලිම් | වෙනත් |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |

8.0 2009 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල :

8.1 වර්ෂය : ☐☐☐☐ විභාගයට පෙනී සිටි මාධ්‍ය : ............

8.2 විභාග අංකය : ☐☐☐☐☐☐☐☐

8.3 Z අගය : ☐ ☐☐☐☐ Z අගය සෘණ නම් අදාළ කොටුවේ M අක්ෂරය යොදන්න ☐

8.4 ප්‍රතිඵල විස්තරය විෂයය අනුව :

| විෂයය | විෂය අංකය | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|
| 1. ............................................. | ........................ | ........................ |
| 2. ............................................. | ........................ | ........................ |
| 3. ............................................. | ........................ | ........................ |

9.0 9.1 ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවල අයැදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට ලැබූ

ඉහළම ශ්‍රේණිය : ☐ විෂය අංකය : ☐☐

විභාග අංකය : ☐☐☐☐☐☐☐☐ වර්ෂය: ☐☐☐☐

9.2 ඔබ ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයැදුම්කරන්නේ ද ? ඔව් [1] නැත [2]

9.3 එසේ නම් වතු සේවක දරුවෙක් ද ? නැද්ද යන වග (අදාළ කොටුවේ X ලකුණෙන් දැක්විය යුතුයි.)

ඔව් [1] නැත [2]

9.4 ශාරීරික අධ්‍යාපනය සිංහල/දෙමළ අයැදුම්කරුවන් තම අයැදුම්පතෙහි 12.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව : [ ]

9.5 9.5.1.1.දෙවන බස (සිංහල) පාඨමාලාව සඳහා අයැදුම්කරන අයැදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ)

භාෂාවට ලැබූ ඉහළම ශ්‍රේණිය : [ ] විෂය අංකය : [ | ]

9.5.12 දෙවන බස (දෙමළ) පාඨමාලාව සඳහා අයැදුම්කරන අයැදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල)

භාෂාවට ලැබූ ඉහළම ශ්‍රේණිය : [ ] විෂයය අංකය : [ | ]

10.0 2009 වර්ෂයට පෙර ඔබ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනීසිටියේ එක් විෂයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| | | |
|---|---|---|
| 10.1 විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 |
| 10.2 වර්ෂය : | ................ | .................. |
| 10.3 විභාග අංකය : | ................ | .................. |
| 10.4 විභාග මධ්‍යස්ථානයේ අංකය : | ................ | .................. |
| 10.5 Z අගය : | ................ | .................. |

10.6 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| .................. | .................... | .................. | .................... |
| .................. | .................... | .................. | .................... |
| .................. | .................... | .................. | .................... |

11.0 සමත් වූ අ.පො.ස (සා.පෙළ) පිළිබඳ විස්තර :

| | | | |
|---|---|---|---|
| 11.1 විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 | 3 |
| 11.2 වර්ෂය : | .................. | .................. | .................. |
| 11.3 විභාග අංකය : | .................. | .................. | .................. |
| 11.4 විභාග මධ්‍යස්ථානයේ අංකය : | .................. | .................. | .................. |
| 11.5 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි : | .................. | .................. | .................. |

| *(1 වාරය)* | | *(2 වාරය)* | | *(3 වාරය)* | |
|---|---|---|---|---|---|
| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
| 1. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 2. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 3. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 4. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 5. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 6. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 7. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 8. ........................ | ........................ | ........................ | ........................ | ........................ | ........................ |

12.0 *ගැසට් නිවේදනයේ 4.4 ඡේදයේ 4.4.3 හා 4.4.4 වගන්තීන්ට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර :*

(ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අයැදුම්කරන අය පමණක් පිරවිය යුතුය.) මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.4.3 හි සියළු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/නිපුණතා තුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ.පො.ස (සා.පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමාර්ථ ලබා ඇත්නම් 4.4.4 ට අනුව ශ්‍රේණියට හිමි ලකුණ ද පහත කොටසෙහි සඳහන් කළ යුතුය. මුළු ලකුණුවල එකතුව මුල් පිටුවේ 9.4 හි ද ඇතුළත් කළ යුතුය.

| *අනු අංකය* | *වර්ෂය* | *නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/ සංගමය* | *තරග නියෝජනය කළ මට්ටම අන්තර්ජාතික/ජාතික/ පළාත්/දිස්ත්‍රික්කය/කලාප* | *ඉසව්ව/ක්‍රීඩාව* | *ලැබූ ස්ථානය* | *4.4.3 ට අදාළ ලකුණු* |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| අ.පො.ස (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට ලද ශ්‍රේණිය | | | | | ලකුණු | |
| | | | | මුළු එකතුව | | |

13.0 *ගැසට් නිවේදනයේ 4.6 වගන්තියේ (අ) අනුව ප්‍රාචීණ ප්‍රාරම්භ, බෞද්ධ ධර්මාචාර්ය. පිරිවෙන් අවසාන විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර ඇත්නම් ඇතුළත් කරන්න.*

| *විභාගය* | *ප්‍රාචීණ ප්‍රාරම්භ* | *බෞද්ධ ධර්මාචාර්ය* | *පිරිවෙන් අවසාන* | *දහම් පාසල් අවසාන* |
|---|---|---|---|---|
| 13.1 වර්ෂය | | | | |
| 13.2 විභාග අංකය | | | | |
| 13.3 මධ්‍යස්ථාන අංකය | | | | |
| 13.4 විෂයය හා ශ්‍රේණිය | 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10<br>11. | |

14.0 *ගැසට් නිවේදනයේ 4.9 ඡේදය අනුව කතෝලික/ක්‍රිස්තියානි ධර්මය අයැදුම්කරුවන් විසින් අදාළ කොටස සම්පූර්ණ කළ යුතුයි.*

| *පාඨමාලාවේ නම/සහතිකය* | *හදාරන ලද කාලය* | | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| | *සිට* | *දක්වා* | |
| 14.1 දේව ධර්මය පිළිබඳ පාඨමාලාව (BTH) | | | |
| 14.2 ජාතික දෙව්සත්හලේ කිතුනු දර්ශනය පිළිබඳ පාඨමාලා සහතිකය. | | | |
| 14.3 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය | | | |
| 14.4 දේව ධර්ම නිකේතනය මගින් පවත්වන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. | | | |

| පාඨමාලාවේ නම/සහතිකය | හදාරන ලද කාලය | | ලබා ඇති සාමාර්ථය |
|---|---|---|---|
| | සිට | දක්වා | |
| 14.5 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යාපන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකේතනයේ ශ්‍රේෂ්ඨාධිපති/ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමා විසින් නිකුත් කරන ලද සහතිකය. | | | |
| 14.6 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම. | | | |
| 14.7 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. | | | |
| 14.8 කතෝලික/ක්‍රිස්තියානි ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලිකයින් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය/ක්‍රිස්තියානිකයින් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය. | | | |
| 14.9 අ. පො. ස. (උසස් පෙළ) ක්‍රිස්තු ධර්මය විෂයය සමත්වීම. | | | |

15.0 ගැසට් නිවේදනයේ 4.7 සහ 4.8 සඳහා හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය, අයැදුම්කරුවන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතුයි.

| පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

16.0 ගැසට් නිවේදනයේ 4.12 පාඨමාලාව අයැදුම්කරන්නන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතුයි.

16.1 ඉල්ලුම් කරන්නේ නිර්මාණකරණය හා තාක්ෂණ වේදය/ශිල්ප කලාද යන්න :..............................

16.2 ගැසට් නිවේදනයේ 4.12.3 ඡේදයේ තාක්ෂණ අධ්‍යයනය පාඨමාලාවට අනුව ඇතුළත් වීමට අපේක්ෂිත අයැදුම්කරුවන් රජයේ පිළිගත් ආයතනයකින් ශිල්පීය පාඨමාලාවක් හදාරා නිම කොට තිබේ නම් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුයි. :-

| ශිල්පීය පාඨමාලාවේ නම | රජයේ ලියාපදිංචි අංකය හා වලංගු දිනය | පවත්වන ලද ආයතනය | කාල සීමාව | පාඨමාලාව සාර්ථක ලෙස නිමකර තිබේ ද? |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

17.0 ගැසට් නිවේදනයේ 4.16.1, 4.16.2 ඡේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් සංගීතය පිළිබඳ නිපුණතාවයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය.

| වර්ෂය | සහතිකය නිකුත් කළ ආයතනය | ප්‍රවීණතාව/සමත් පන්තිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

18.0 *අයැදුම්කරුගේ ප්‍රකාශය* :

(i) මා විසින් ඉදිරිපත් කර ඇත්තේ එක් අයැදුම්පත්‍රයක් හා සහතික කළ ඡායා පිටපත් දෙකක් පමණි. එක් ඉල්ලුම් පත්‍රයක් හා එහි ඡායා පිටපත් දෙකකට වඩා ඉදිරිපත් කළ විට මාගේ සියළුම අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප වන බව මම දනිමි.

(ii) මා විසින් අයැදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මා දනිමි.

(iii) මා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයැදුම්කර නොමැති බවත්, විශ්වවිද්‍යාලයක/විශ්වවිද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් මෙයින් සහතික කරමි.

————————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————————.

19. *පාසල්/පිරිවෙන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් විදුහල්පතිගේ/පිරිවෙන් අධිපතිගේ ප්‍රකාශය* :

මෙම අයැදුම්කරු මෙම පාසලේ/පිරිවෙනේ ශිෂ්‍යයෙකු වශයෙන් අ.පො.ස (සා.පෙළ) විභාගයට හා අ.පො.ස (උ.පෙළ) විභාගයට/ප්‍රාචීණ ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි බවත්, අයැදුම්කරු විසින් ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනුමේ හැටියට නිවැරදි බවත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව …………………… වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අයැදුම්කරු ලබා ගෙන ඇති Z අගය …………………… (අකුරෙන්)…………………… බවත් සහතික කරමි.

————————,
විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ
අත්සන හා නිල මුද්‍රාව.

විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ නම :————————.
පාසලේ/පිරිවෙනේ නම හා ලිපිනය :————————.
දිනය :————————.

20. *පෞද්ගලික අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය* :

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ...................... වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී මා ලැබූ ඒකාබද්ධ ලකුණු/ Z ලකුණු .................... (අකුරෙන්) .................. බව සහතික කරමි.

————————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————————.

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

————————,
සාමදාන විනිශ්චයකාරතැනගේ අත්සන.
නම ඃ
නිල මුද්‍රාව.

දිනය :————————.

07-276

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහාවන සීමිත තරග විභාගය - 2009**

මෙම නිවේදනයේ 'ලේකම්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ය. ' සේවය' යන පදයෙන් අදහස් කෙරෙන්නේ, ශ්‍රී ලංකා පරිපාලන සේවය යි.

1. *ලිඛිත විභාගය* : මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ :-

(i) සාමාන්‍ය පරිපාලනය;
(ii) මුදල් රෙගුලාසි;
(iii) විෂයානුබද්ධ අධ්‍යයනය.

*විභාග දිනය.*—මෙම විභාගය 2010 ඔක්තෝබර් මස කොළඹ නගරයේ දී (නගර අංක 01) හා යාපනය නගරයේ දී (නගර අංක 02) පැවැත්වෙනවා ඇත. මේ අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය නිවැරදිව ඉල්ලුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සටහන් කරන්න. විභාගයට ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට කිසිසේත්ම ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය.*—ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටියා වූ ද, සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූ ද, අයැදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූ ද, අපේක්ෂකයන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

2. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. *සේවා කොන්දේසි.*—රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1419/3 සහ 2005.11.14 වැනි දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද) 2005.10.28 වැනි දින දරන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත් ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වැනි පන්තියට පත් කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයැදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය වෙත බලය ඇත.

4. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය* :

විශේෂ ශ්‍රේණිය - රු. 42,390 - 12 x 1,310 - රු. 58,110
I වැනි පන්තිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555
II වැනි පන්තිය - රු. 30,175 - 8 x 790 - රු. 35,705
III වැනි පන්තිය - රු. 22,935 - 10 x 645 - රු. 29,385

(පත්වීමේ දින සිට වසර 03ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම සහ පත්වීමේ දින සිට වසර 06ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම ලැබ වසර 05ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.).

මෙම විභාගය මඟින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තිය සඳහා වේ.

5. *සුදුසුකම්* : මෙම ඡේදයේ අවසානයේ ඇති සටහන්වල විධිවිධානයන්ට යටත්ව

(අ) (i) 2009.12.31 දිනට පහත සඳහන් සේවා/ශ්‍රේණිවල ස්ථිර කරන ලද රජයේ නිලධාරියකු වන;

සහ

(ii) 2009.12.31 දිනට එවැනි සේවා/ශ්‍රේණි එකක් හෝ ඊට වැඩි ගණනක හෝ අවු. 10කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවයේ නියුතුව සිටින;

හෝ

(ආ) (i) 2009.12.31 දිනට පහත සඳහන් සේවා/ශ්‍රේණිවල ස්ථිර කරන ලද රජයේ නිලධාරියකු වන හා එවැනි සේවා/ශ්‍රේණි එකක හෝ ඊට වැඩි ගණනක හෝ අවු. 05කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවයේ නියුතුව සිටින;

හා

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු වීම.

සටහන : (අ) උපාධිය බලපවත්නා දිනය, 2009.12.31 දින හෝ ඊට පෙර දිනයක් විය යුතු අතර, එදිනට හෝ ඊට පෙර හෝ ඉහත 5.අ (i) සහ (ii) හෝ 5. (ආ) (i) සහ (ii) හි දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින්ද යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

*සේවා හා ශ්‍රේණි :*

(i) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් යටතේ පාලනයවන පහත සඳහන් ඕනෑම ඒකාබද්ධ සේවයකට අයත් නිලධාරියකු
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්, භාෂා පරිවර්තක, පුස්තකාලයාධිපති

(ii) පහත සඳහන් ඕනෑම ලිපිකරු සේවයකට අයත් නිලධාරියකු—
දුම්රිය, රජයේ මුද්‍රණාලය, සෞඛ්‍ය

(iii) පහත සඳහන් ඕනෑම දෙපාර්තමේන්තු ශ්‍රේණියක නිලධාරියකු හෝ එවැනි ශ්‍රේණියක සේවය කොට පසුව පළාත් රාජ්‍ය සේවයේ සමාන ශ්‍රේණියකට අන්තර්ග්‍රහණය කළ නිලධාරියකු :-

| *දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ* | *ශ්‍රේණි* |
|---|---|
| සියලුම අමාත්‍යාංශ | සහකාර ලේකම් (ශ්‍රී ලං. ප. සේ. නොවන)<br>මහජන සම්බන්ධතා නිලධාරි |
| තරුණ කටයුතු අමාත්‍යාංශය<br>ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)/දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි,<br>ක්‍රීඩා නිලධාරි |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය<br>ප්‍රතිපත්ති ක්‍රම සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව | ව්‍යාපෘති නිලධාරි, සංඛ්‍යාන මිනුම් නිලධාරි, සංඛ්‍යාන<br>සහකාර, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරි |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි, බලයලත් නිලධාරි |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | සංඛ්‍යා ලේඛන විමර්ශක |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය<br>ආයුර්වේද දෙපාර්තමේන්තුව | රෝහල් ලේකම්<br>විමර්ශන නිලධාරි |
| සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය<br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුමය)<br>සුභසාධන හා සමාජ සුභසාධන අධිකාරි,<br>වැඩිහිටි හා ආබාධිත නිවාස අධිකාරි<br>සමාජ සේවා නිලධාරි |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මුල් ගුරු, මුල් ගුරුවරිය, පරිවාස නිලධාරි,<br>නේවාසිකාගාර පාලක, නිවාස පාලක, නිවාස පාලිකා |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | ඉඩම් නිලධාරි/දිස්ත්‍රික් ඉඩම් නිලධාරි<br>(දෙපාර්තමේන්තුමය)/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි<br>කච්චේරි මිනින්දෝරු/ජනපද නිලධාරි |
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ග්‍රාම නිලධාරි |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | පර්යේෂණ සහකාර, පරිවර්තක |
| කම්කරු සබඳතා සහ මිනිස් බල අමාත්‍යාංශය | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | කර්මාන්ත සහකාර, සාමාන්‍යාධිකාරි, කළමනාකරණ සහකාර,<br>ආර්ථික සහකාර, කාර්මික සහකාර |

| දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ | ශ්‍රේණි |
|---|---|
| සෞඛ්‍ය ආරක්‍ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය | රෝහල් ලේකම්, සැලසුම් හා වැඩසටහන් නිලධාරි, මහජන සෞඛ්‍ය පරීක්‍ෂක, ලියාපදිංචි හා සහකාර වෛද්‍ය නිලධාරි |
| පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය<br>පළාත් සභා දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය), පළාත් පාලන ලිපිකරු නිලධාරි, භාෂා පරිවර්තක, සරප්, ලඝු ලේඛක, යතුරු ලේඛක, ගබඩාභාර නිලධාරි |
| වෙළෙඳ, අළෙවි සංවර්ධන හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය<br>මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | කිරුම් මිණුම් පරීක්‍ෂක, මිල පාලන පරීක්‍ෂක |
| කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම උපදේශක<br>ප්‍රාදේශීය නිලධාරි<br>සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව<br>ශ්‍රේෂ්ඨාධිකරණය | භාෂා පරිවර්තක, ප්‍රකාශන සහකාර, ලඝු ලේඛක |
| ප්‍රවාහන අමාත්‍යාංශය<br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ වාහන පරීක්‍ෂක |
| වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සැලසුම් සහකාර |
| මධ්‍යම ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරි/ග්‍රාම සංවර්ධන ජ්‍යෙෂ්ඨ අධීක්‍ෂක/ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන සහකාර/ග්‍රාම සංවර්ධන නිලධාරි/ග්‍රාම සංවර්ධන සහකාර |
| සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>ජාතික කෞතුකාගාරය<br>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික නිලධාරීන් |
| අධ්‍යාපන අමාත්‍යාංශය | ශිෂ්‍ය නිවාස අධිකාරි |
| තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>රජයේ මුද්‍රණාලය | ප්‍රවෘත්ති නිලධාරි<br><br>සෝදුපත් කියවන්නා |
| තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය<br>තැපැල් දෙපාර්තමේන්තුව | ටී 3-5-1 හා ටී-3-4 වැටුප් පරිමාණයේ සිටින ඒකාබද්ධ තැපැල් සේවා නිලධාරීන්, ඒකාබද්ධ තැපැල් සේවයේ තැපැල් සේවා නිලධාරීන් ආ 1 |
| ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ධීවර සහකාර |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් නිලධාරි/සමූපකාර සමිති පරීක්‍ෂක |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | ආහාර පාලන පරීක්‍ෂක (කලින් ආහාර හා මිල පරීක්‍ෂක) |

(ඇ) පළාත් රාජ්‍ය සේවයේ ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් ඕනෑම සේවයක නිලධාරියකු : ලිපිකරු, ලඝු ලේඛක, යතුරු ලේඛක, සරප්, පොත් තබන්නා, පරිවර්තක, ගබඩා භාරකරු, පුස්තකාලයාධිපති.

(ඉ) පළාත් රාජ්‍ය සේවයේ ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් ඕනෑම සේවයක නිලධාරියකු : ආදායම් පරීක්‍ෂක, කම්කරු හා සුභසාධන නිලධාරි, කිරුම් මිනුම් පරීක්‍ෂක, කොළඹ මහ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහන නිලධාරි, මාණ්ඩලික නිලධාරි සහ ලේකම්, කළමනාකරණ සේවා නිලධාරි, පළාත් පාලන නිලධාරි.

(ඊ) මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන තනතුරුවලට අයත් නිලධාරීන් විභාගයට අයැදුම්කිරීම නීති විරෝධීවන අතර (තනතුරු නාමයන් වෙනස්වීම හේතුවෙන් නව තනතුරුවලට අනතර්ග්‍රහණය කර ඇති නිලධාරීන් හැර) ඔවුන් යම් ආකාරයකින් විභාගයට පෙනී සිටිය ද පත්වීම් සඳහා සළකා බලනු නොලැබේ.

සටහන : (i) 2009.12.31 දිනට පූර්වාසන්න අවුරුදු 5 තුළ සතුටුදායක සේවා වාර්තාවක් නොමැති නම් විභාගයට පෙනී සිටිය ද පත්වීම් සඳහා සළකා බලනු නොලැබේ.

(ii) අයැදුම්කරුවකු—

(අ) සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇත්නම් ද, සහ

(ආ) මෙම කාලය තුළ කරන ලද වරදකට (අවවාද කිරීම් හැර) කිසියම් දඬුවමක් ලබා නැත්නම් ද, ඔහුට සතුටුදායක සේවාවක් තිබුනේ යැයි සළකනු ලැබේ.

(iii) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියකු සුදුස්සකු නොවේ.

(iv) ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 5(1) හෝ 5(2) හෝ ප්‍රකාර තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිවකුට අවසර නොමැත.

6. *විභාග ගාස්තු.*—විභාගය සඳහා වූ ගාස්තුව රු. 500 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ආදායම් ශීර්ෂ 20-03-20-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 1/2 x 12 A4) ප්‍රමාණයේ කඩදාසියක, ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 3.11 තෙක් පළමුවන පිටුවේ ද, 4.0 සිට 6.0 II තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය තුන්වන පිටුවේ ද යන පරිද්දෙන් තම ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) විභාගය පිණිසවන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල් වෙත 2010 අගෝස්තු 09 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. ඉල්ලුම්පත් බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරෙහි පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමටවන සීමිත තරග විභාගය 2009" යන වචන සටහන් වී තිබිය යුතුය. එදිනට පසු ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(ඉ) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

8. *විභාගයට ඇතුළුවීම :*

(අ) ඉල්ලුම්පත් එවා ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංක යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළකර ඇත.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* : අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහුට හෝ ඇයට විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

9. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව*.—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත. :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක් ;
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම*.—අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණු සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. *විභාග ක්‍රමය - විභාග මාධ්‍යය* :

(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.;

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රජයේ සේවයට ඇතුළත්වීම පිණිස වූ සුදුසුකම් ලබාගැනීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

*සටහන* : (i) අපේක්ෂකයකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ii) ඉල්ලුම්පතෙහි සඳහන් විභාග භාෂාව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය* :
(අ) පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක්, :-

| | | |
|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | - ලකුණු 100 යි | - කාලය පැය 03 යි |
| මුදල් රෙගුලාසි | - ලකුණු 100 යි | - කාලය පැය 03 යි |
| විෂයානුබද්ධ අධ්‍යයනය | - ලකුණු 100 යි | - කාලය පැය 02 යි |

(ආ) වාචික පරීක්ෂණය - ලකුණු 25 කි.

ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරෙන් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගත්තා වූ ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තාවූ ද, අපේක්ෂකයන් පමණක් වාචික පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටීනම්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ලකුණු ලබාදීමේ ක්‍රමය රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ අනුමත කරනු ලැබේ.).

*සටහන* : වාචික පරීක්ෂණය සඳහා කැඳවීම, පත්වීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ. සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි වේ.

එක් වරක දී පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය මගින් තීරණය කරනු ලැබේ.

14. *විෂයය නිර්දේශය* :

(අ) *සාමාන්‍ය පරිපාලනය*.—රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009. 02.20 දිනැති රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ පහත දැක්වෙන පරිච්ඡේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආයතන සංග්‍රහයේ විධිවිධාන, කාර්යාල පරිචය හා කාර්යාල ක්‍රම සහ තත්කාලීනව භාවිත වන චක්‍රලේඛ උපදෙස් පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. :-

V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

(ආ) *මුදල් රෙගුලාසි :*
 (i) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 1 වැනි කොටස (X වන පරිච්ඡේදය හැර)
 (ii) ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු - ඒවා පිළියෙළ කිරීම ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජනය
 (iii) කච්චේරිවලට අදාළ වන විශේෂිත ගිණුම්වලට අදාළ ආඥාපනත්,

(ඇ) *විෂයානුබද්ධ අධ්‍යයනය.*—අපේක්ෂකයාගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරුණු ප්‍රශ්න පත්‍රයකි. මේ සඳහා අපේක්ෂකයා විසින් විසඳුම් ලබා දෙනු පිණිස ප්‍රස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද ගැටලු ඔහුට යොමු කරනු ඇත.

මෙම විභාගය සඳහා අයදුම්කරන හෝ අයදුම්කරන ලද අපේක්ෂකයන්ගේ සුදුසුකම් පිළිබඳ සීමා හෝ මෙම ගැසට් නිවේදනයේ වෙනත් අපැහැදිලි කොටස් පිළිබඳ හෝ තීරණයක් ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය සතු වේ.

අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 ජුනි මස 24 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

## ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යි.)

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2009**

Limited Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Administrative Service - 2009

| | |
|---|---|
| 1. 0 මාධ්‍යය : | 2.0 නගරය : |
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය |
| සිංහල - 2 | |
| දෙමළ - 3 | |
| ඉංග්‍රීසි - 4 | එම නගර අංකය |
| (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) | |
| * ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළයුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි. | (විභාග නිවේදනයේ 1 වන ඡේදයට අනුව) (නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) |

3.0 පෞද්ගලික තොරතුරු :

3.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : *උදාහරණ : SILVA, A. B.*

3.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 කාර්යාලයීය ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

3.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.7 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
ස්ත්‍රී - 1

3.8 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න.
විවාහක - 2

3.9 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ -2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් -5) - අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]

3.10 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

3.11 උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

4.0 ඔබ සේවයට/ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණ සමත් වූ භාෂාව සඳහන් කරන්න. :—————.

5.0 (i) ගැසට් නිවේදයේ 5 වන ඡේදයේ සඳහන් සේවා දෙපාර්තමේන්තු ශ්‍රේණිවලින් ඔබේ සේවාව/ශ්‍රේණිය (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් ඇත්නම්) එය සඳහන් කළ යුතුය. සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි එකකට වැඩි ගණනක ඔබ සේවය කර ඇත්නම්, එම සේවාවන් හා ශ්‍රේණීන් දිනයන් සහිතව සඳහන් කළ යුතුය.) :—————.

(අ) දැනට දරන තනතුර :—————.
තනතුර අයත් සේවය : (රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය) :—————.
ශ්‍රේණිය :—————.
පන්තිය/ඛණ්ඩය :—————.
තනතුරට පත් වූ දිනය :—————.
එම තනතුරේ ස්ථිර කළ දිනය :—————.
උපාධිය ලැබූ දිනය :—————.

(ආ) සුදුසුකම් ලබාදෙන අනෙකුත් සේවාවන්/ශ්‍රේණීන් (ඇත්නම්)

| *සේවය/ශ්‍රේණිය නම* | *පත් වූ දිනය* | *ස්ථිර කළ දිනය* | *සේවා කාලය……… දින සිට ……දක්වා* |
|---|---|---|---|
| (1) …………………… | …………………… | …………………… | …………………… |
| (2) …………………… | …………………… | …………………… | …………………… |
| (3) …………………… | …………………… | …………………… | …………………… |
| (4) …………………… | …………………… | …………………… | …………………… |
| (5) …………………… | …………………… | …………………… | …………………… |

(ii) ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ සඳහන් කර ඇති සේවාවන්/ශ්‍රේණිවල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ස්ථිර සහ අඛණ්ඩ මුළු සේවා කාලය :—————.

6. 0 (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටි වර්ෂ :

(i) ……………………
(ii) ……………………
(iii) ……………………
(iv) ……………………
(v) ……………………
(vi) ……………………

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට පෙනී සිටි වර්ෂ :

(i) ……………………
(ii) ……………………
(iii) ……………………

7.0 මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න. :

| |
|---|
| (ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.)<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

8.0 අයදුම්කරුගේ සහතිකය :

........................ දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ........................ හා ........................ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (පෞද්ගලික ලිපිගොනුවට අනුව)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ...................................... මයා./මිය./මෙනවිය ..................... වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාලසීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල ම උපයාගෙන ඇති බව ද, එම කාලසීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු, වාර්තා ආශ්‍රයෙන් නිවැරදි යයි සොයාගෙන ඇති බව ද, අදාළ ගැසට් නිවේදනයන්හි සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී, මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :—————.
දිනය :—————.
(නිල මුද්‍රාව යොදන්න.)

07-307

---

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහාවූ I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008 (2009)

ඉහත සේවාවේ නිලධාරීන් සඳහාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාග 2010 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2010 ජුනි මස 01 වැනි දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාවේ යෙදී සිටින නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂයය නිර්දේශය.—I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂයය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහා වූ විෂයය නිර්දේශය ඇමුණුම "අ" හිත් කාර්යක්ෂමතා කඩඉම් II සඳහා වූ විෂයය නිර්දේශය ඇමුණුම "ආ" හිත් සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය. :

**ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවය**

| *I වැනි කාර්යක්ෂමතා කඩඉම* | | | *II වැනි කාර්යක්ෂමතා කඩඉම* | | |
|---|---|---|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* | *විෂයය* | *කාලය (පැය)* |
| 01 | කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය | 02 | 03 | කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය | 02 |
| 02 | මුදල් රෙගුලාසි | 02 | 04 | මුදල් රෙගුලාසි | 02 |

*සටහන*.—I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකෙන් ම සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40%ක් බැගින් හෝ ඊට වැඩියෙන් හෝ ලකුණු ලබාගත යුතු ය.

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරඟ විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.

06. ඉහත දැක්වෙන ප්‍රශ්නපත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අනුබද්ධ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. **ඉහත සඳහන් විභාග දෙකට ම පෙනී සිටින්නේ නම්, වෙන වෙනම එක් එක් විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.**

09. විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

10. ඉල්ලුම්පත්‍ර ජූලි මස 29 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි ආයතන ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් එලදායී වනු ඇත.

නුදුරුව සිටින අයට පණිවිඩකරුවකු මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විභාග ශාඛාවට දැනුම්දීමට උපදෙස් දෙනු ලැබේ.

12. ඉහත II වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ274 දරන චක්‍රලේඛය කෙරෙහි සියලුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ **පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.** විභාගය ආරම්භ වන දිනයේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :—

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා රු. ශත
සම්පූර්ණ විභාගය සඳහා 100 0
එක් විෂයයකට 50 0
අපේක්ෂකයින් විසින් අත්සන තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මඟින් ගාස්තු ගෙවිය යුතු ය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ.

ඒ. එච්. ගමගේ,
ලේකම්,
පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2010 ජූනි මස 21 වැනි දින,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

ආදර්ශ අයදුම් පත්‍රය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාවේ නිලධාරීන් සඳහා වූ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය - 2008 (2009)
Efficency Bar Examination for the Officers in the Sri Lanka Livestock Development Officers Service - 2008 (2009)

(විභාගයේ නම ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

* නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

නිලධාරියා ඉල්ලුම් කරන විභාගය :
පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 1
☐
දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (අ) මුලකුරු අගට යොදා මුල් අකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———. උදා : FERNANDO, B. A.
(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.

02. උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

03. පදවි නාමය :———.
දෙපාර්තමේන්තුවේ නම :———.

04. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.

05. ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාවට පත්කරන ලද දිනය :———.

06. නිවේදනයේ 04 වන ඡේදයේ දක්වා ඇති, විෂයය අංක සහිතව පෙනී සිටීමට අපේක්‍ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතුය.)

(i) විෂය අංකය ☐☐ විෂයය :———.

(ii) විෂය අංකය ☐☐ විෂයය :———.

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන්ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :———.

08. ජාතික හැඳුනුම්පත් අංකය :

☐☐☐☐☐☐☐☐☐☐

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

මෙම ඉල්ලුම් පත්‍රයට අලවන ලද මුද්දර ම විසින්ම අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද ඒවා බව ද ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව රු. :—,

මුද්දර කොටුව

———,
අපේක්‍ෂකයාගේ අත්සන

දිනය :———.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල් මඟින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්‍ෂකයාට/අපේක්‍ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්‍ෂකයා/අපේක්‍ෂිකාව රු. ............ වටිනා මුද්දර/මුද්දරය නිසි පරිදි අවලංගු කර ඇති බව ද සහතික කරමි. අපේක්‍ෂකයාගේ අත්සන සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :———.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය.)

*"අ" ඇමුණුම*

(අ) ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයන්ගෙන් සමන්විත වේ.

1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය (මුළු ලකුණු 100කි.)
2. මුදල් රෙගුලාසි (මුළු ලකුණු 100කි.)

1. *කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය*

කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

ආයතන සංග්‍රහය.—පරිච්ඡේද II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX, XLVIII

**සටහන*.—සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40% ක් අපේක්‍ෂකයකු විසින් ලබාගත යුතු ය.

*2. මුදල් රෙගුලාසි*

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

**I වැනි පරිච්ඡේදය**

වියදම් හා ආදායම් ඇස්තමේන්තු,
ඒකාබද්ධ අරමුදල වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු. රෙ. 1 සිට 68 දක්වා).

**III වැනි පරිච්ඡේදය**

*මූල්‍ය කළමනාකරණය හා උත්තරාදායී බව :*

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ගණන්දීමේ නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම කාර්යය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)

මෙයට අමතරව නව ටෙන්ඩර් පරිපාටි සංග්‍රහයේ 12 වන පරිච්ඡේදය යටතේ වන කරුණු ද එම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වනු ඇත.

**සටහන :* සමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% අපේක්ෂකයකු විසින් ලබාගත යුතු ය.

ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකි ය.

***"ආ" ඇමුණුම***

(ආ) ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වූ 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයන්ගෙන් සමන්විත වේ.

1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය (මුළු ලකුණු 100කි.)
2. මුදල් රෙගුලාසි (මුළු ලකුණු 100කි.)

*1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය*

කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

*ආයතන සංග්‍රහය.*—පරිච්ඡේද XV, XVI, XXIII, XXIV, XXV XXVII, XXVIII, XXX, XLVII, XLVIII නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ.

**සටහන.*—සමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතු ය.

*2. මුදල් රෙගුලාසි*

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

**VI වැනි පරිච්ඡේදය**

ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මූල්‍ය සුරක්ෂිත භාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මු. රෙ. 315 සිට 396 දක්වා)

**XIII වැනි පරිච්ඡේදය**

*සැපයුම් වැඩ හා සේවා :*
සැපයීම් මිළට ගැනීමේ ක්‍රියාවලිය ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය කොන්ත්‍රාත් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම (මු. රෙ. 708 සිට 775 දක්වා)

මෙයට අමතරව නව ප්‍රසම්පාදන පරිපාටි සංග්‍රහයේ 12 වන පරිච්ඡේදය යටතේ වන කරුණු ද එම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වනු ඇත.

**සටහන.*—සමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය. ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.

07-302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.